**උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ ( උමාසව්‍යා) - මූල් විෂය පථය හා අතිරේක මූල්‍යයනය - 2014**

---

උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2010 අගෝස්තු 27 දින එළඹි අංක 2639-එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ණය ගිවිසුම අනුව, එවකට වරාය හා මහා මාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහා මාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ජාතික මට්ටමින් ව්‍යාපෘති කාර්යයන් කළමනාකරණය හා සම්බන්ධීකරණය සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය වගකිව යුතු වේ. උතුරු පළාතේ හා උතුරු මැද පළාතේ කිලෝ මීටර් 170 ක ජාතික මාර්ග පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ ආරම්භක ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 18,980 කට සමාන එජඩො මිලියන 146 ක් වන අතර ඉන් රු.මිලියන 14,950 කට සමාන එ ජ ඩො මිලියන 130 ක් මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. තවද, උතුරු පළාතේ සහ උතුරු මැද පළාතේ දළ වශයෙන් ජාතික මහා මාර්ග කිලෝමීටර් 288 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා 2013 මැයි 31 දිනැති ණය අංක 2890 එස්ආර්අයි (එස්එෆ්) යටතේ රු.මිලියන 8,840 කට සමාන එජඩො මිලියන 68.34 ක් සහ 2013 මැයි 31 දිනැති ණය අංක 2891 එස්ආර්අයි යටතේ රු.මිලියන 3,900 කට සමාන එජඩො මිලියන 30 ක අතිරේක මූල්‍යයනයක් ආසියානු සංවර්ධන බැංකුව විසින් වෙන් කර තිබුණි. ආරම්භක ණය ගිවිසුම යටතේ 2010 ඔක්තෝබර් 22 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කරන ලද අතර 2015 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. අතිරේක මූල්‍යයන සැලසුම් යටතේ ව්‍යාපෘතියේ කාර්යයන් 2013 මැයි 13 දින ආරම්භ කරන ලද අතර, 2018 ජූනි 30 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම

පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් හා ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද යාවත්කාලීන කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල් වලින් ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද වියදම , මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය , ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව,

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල් , ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතින් වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

---------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---------------

**2.1 මතය**

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර , මාගේ මතය වනුයේ ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුම්වල නියම කර ඇති අවශ්‍යතාවන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතින්වලට අනුකූල වී ඇති බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

---

### 2.2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

---

පහත සඳහන් අවස්ථා නිරීක්ෂණය විය.

(අ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 8.3.9 ඡේද වලට පටහැනිව ව්‍යාපෘතියට අනුයුක්ත කරන ලද මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයන් සඳහා ප්‍රසාද දීමනා හා වෛද්‍යාධාර දීමනා රු.745,390 ක් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන චක්‍රලේඛයට පටහැනිව, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වා දෙන ලද සූත්‍රයක් පදනම් කර ගෙන ව්‍යාපෘතිය සඳහා අනුයුක්ත කරන ලද මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයන් සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.24,129,037 ක වැටුප් ගෙවා තිබුණි.

(ඇ) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය සඳහා බදු ගෙවීම් නිදහස් කිරීමක් අනුමත කර තිබුණද, මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 8.6 ඡේදයේ උපදෙස් වලට පටහැනිව, සමාලෝචිත වර්ෂය තුළ රු.512,648 ක් වූ එකතු කළ අගය මත බදු ගෙවා තිබුණි.

(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 ඡේදයෙහි දක්වා ඇති පරිදි යම් කොන්ත්‍රාත් කාර්යයක් සඳහා වැඩ පූර්ව අත්තිකාරම්, තාවකාලික මුදල් හා අසම්භාව්‍යයන් හැර කොන්ත්‍රාත් මුදල මත ගෙවිය යුතුය. කෙසේ වුවද ඉහත උපදෙස් වලට පටහැනිව තාවකාලික මුදල් හා අසම්භාව්‍යයන් ඇතුළත්ව රු.මිලියන 3,811 ක් වැඩ පූර්ව අත්තිකාරම් ලෙස ගණනය කර තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

---

### 3.1 අරමුදල් උපයෝජනය

---

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල් | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | අරමුදල් උපයෝජනය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 2014 වර්ෂය තුළ | 2014 දෙසැම්බර් 31 දක්වා | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ණය 2639 -එස්ආර්අයි | 130 | 14,950 | 2,536.00 | 2,866.40 | 112.37 | 14,609 |
| ණය 2890 - එස්ආර්අයි (එස්එෆ්) | 68 | 8,840 | 2,438.00 | 1,358.30 | 13.30 | 1,694 |
| ණය 2891 - එස්ආර්අයි | 30 | 3,900 | - | 1,257.30 | 11.46 | 1,490 |
| ශ්‍රී ලං ර | - | 2,080 | 18.32 | 41.14 | 0.33 | 44 |
| | 228 | 29,770 | 4,992.32 | 5,523.14 | 137.19 | 17,837 |

ඉහත සඳහන් තොරතුරු අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ වර්ෂ 1 ½ ක කාල පරිච්ඡේදය තුළ වෙන් කරන ලද ණය මුදලින් සියයට 60 ක් උපයෝජනය කර තිබුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

වායාපෘති කටයුතු වැඩවල මුල් විෂය පථය හා අතිරේක අරමුදල් වැඩ පිළිවෙල යටතේ කළ යුතු පුනරුත්ථාපන වැඩ සංරචක දෙකකින් සමන්විත විය. මුල් විෂය පථයේ වැඩ සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම අනුව, කිලෝමීටර් 170 ක දිගින් යුත් උතුරු හා උතුරු මැද පළාත්වල ජාතික මාර්ග 10 ක් නිම කිරීම සඳහා අපේක්ෂා කර තිබුණි. එම මාර්ග පුනරුත්ථාපනය කිරීම සඳහා කොන්ත්‍රාත් පැකේජ 10 ක් ව්‍යාපෘතිය විසින් පිරිනමා තිබූ අතර සියලු පුනරුත්ථාපන වැඩ 2013 දෙසැම්බර් 21 දිනට සම්පූර්ණයෙන් නිම කර තිබුණි. කොන්ත්‍රාත් අදියර II යටතේ කොන්ත්‍රාත්කරුවන් කාර්යසාධනය පදනම් කර ගත් මාර්ග නඩත්තු කොන්ත්‍රාත් සඳහා බැඳී සිටි අතර, ඉදිරි වර්ෂ 03 ක් සඳහා එම මාර්ගවල නඩත්තු වැඩ සිදුකළ යුතුය.

තවද, අතිරේක මූල්‍යායන සැලැස්ම යටතේ උතුරු සහ උතුරු මැද පළාත්වල මාර්ග 10 ක පුනරුත්ථාපන වැඩ සඳහා කොන්ත්‍රාත්තු 2013 හා 2014 වර්ෂවල ලබාදී තිබූ අතර භෞතික ප්‍රගතිය 2014 දෙසැම්බර් 31 දිනට සියයට 30 සිට සියයට 75 දක්වා විය. මෙයින් යාපනය- පන්නායි - කයිට්ස් මාර්ගයේ පුනරුත්ථාපන වැඩ 2013 දෙසැම්බර් මාසයේදී ආරම්භ කර තිබූ අතර 2014 දෙසැම්බර් 31 දිනට සියයට 30.7 මන්දගාමී භෞතික ප්‍රගතියක් දක්වා තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

(අ) ව්‍යාපෘතියේ මුල් විෂය පථය යටතේ ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් පිළිබඳ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දූත මණ්ඩල වාර්තා අනුව, වල්ලායි - අරාලි මාර්ගයේ ස්ථාන කිහිපයක මාර්ග උරහිස් පුළුල් කිරීම හා ආරක්ෂක බැම් ඉදිකිරීම සඳහා නිකුත් කරන ලද නිර්දේශ ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) කාර්යසාධනය පදනම් කර ගත් මාර්ග නඩත්තු වැඩ යටතේ සිදුකරන ලද කාර්යයන් පිළිබඳ සේවා මට්ටම් තීරණය කිරීම සඳහා හා කාර්යසාධන දර්ශකයන් අනුව ගෙවීම් කිරීම සඳහා මාසික කාර්යසාධනය තක්සේරු කිරීමට නිර්නායක ස්ථාපිත කර නොතිබුණි. තවද කාර්යසාධනය පදනම් කර ගත් නඩත්තු කාර්යයන් සඳහා ක්‍රමවේද ප්‍රකාශනයක් කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කර නොතිබුණි. තවද කාර්යසාධනය පදනම් කර ගත් නඩත්තු වැඩ සඳහා කොන්ත්‍රාත්කරුවන් සමඟ වෙනම ගිවිසුම්වලට එළඹ නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස හිමිකම් නිරවුල් කිරීමේදී මතභේද පැන නැගීමේ හැකියාව විගණනයේදී බැහැර කළ නොහැක.

(iii) රු.3,181,443 ක පිරිවැයකට සිදුකරන ලද මාන්කුලම් - මුලතිව් මාර්ගයේ පුනරුත්ථාපන වැඩ පිළිබඳ දෝෂ වගකීම් කාලය 2014 ජූලි මාසයේදී සම්පූර්ණ වී තිබුණි. කෙසේ වුවද අනනුකූල වාර්තාවල පෙන්වාදී තිබූ මාර්ගයේ කිලෝ මීටර් 18 + 446 සිට කිලෝ මීටර් 20 + 720 අතර කොටසේ ස්ථාන 11 ක දෝෂ නිවැරදි කිරීම 2014 දෙසැම්බර් 31 වන විටත් සිදුකර නොතිබුණි.

(ආ) ව්‍යාපෘතියේ අතිරේක අරමුදල් සැලැස්ම යටතේ ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් පිළිබඳව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) උපදේශක සේවා ගිවිසුමේ විධිවිධාන අනුව, උපදේශකගේ කාර්ය මණ්ඩලයට කොන්ත්‍රාත්කරුගෙන් කිසිදු මූල්‍ය හෝ වෙනත් ප්‍රතිලාභ ලැබීම අනුමත කර නොතිබූ නමුත් උපදේශකගේ තාක්ෂණික කාර්ය මණ්ඩලය වෙනුවෙන් රු.86,810 ක් වූ අතිකාල පිරිවැය කොන්ත්‍රාත්කරු විසින් දරා තිබූ බව නිරීක්ෂණය විය.

(ii) එකඟ වූ කාල සීමාව තුළ කොන්ත්‍රාත් නිම කිරීම පිළිබඳ අවදානම් වලට හේතු වෙමින් අවස්ථා කිහිපයකදී කොන්ත්‍රාත් කාර්යයන් පිළිබඳ අරමුණු සඳහා කොන්ත්‍රාත්කරුවන්ගේ මූල්‍ය හා භෞතික සම්පත් ඵලදායීව උපයෝජනය කර නොතිබූ බව නිරීක්ෂණය විය. යාපනය - පන්නායී - කයිට්ස් මාර්ගයේ පුනරුත්ථාපන වැඩ සඳහා කොන්ත්‍රාත්කරු විසින් තත්ත්ව පාලන කළමනාකරු හා කම්කරුවන් ඇතුළත් මානව සම්පත් ප්‍රමාණවත් පරිදි යොදා ගෙන නොතිබුණි.

(iii) වෙළුම 3 - තාක්ෂණික පිරිවිතර 103.4 ඡේදය අනුව, ආරක්ෂක පෙර සූදානම් හා සතුටුදායක ප්‍රවාහන පාලන සැලසුම්වලට කොන්ත්‍රාත්කරු අනුකූල විය යුතු අතර වැඩ ක්‍රියාත්මක කිරීමේ කාලය තුළදී එය අඛණ්ඩව සිදුකළ යුතුය. මැදවච්චිය - කැබිතිගොල්ලෑව මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේදී ගැඹුරු හෑරීම් ස්ථාන වටා බාධක තබා නොතිබීම, මාර්ගය පටු ස්ථානවලදී මාර්ග සංඥා නොතිබීම ආදිය හේතුවෙන් බරපතල ආරක්ෂණ උල්ලංඝනය කිරීම් තිබූ බව ප්‍රගති වාර්තා හා වැඩ බිම් රැස්වීම් සටහන්වල දැක්වුනි.

(iv) කැබිතිගොල්ලෑව - පදවිය මාර්ගයේ දෝෂ සහිත ස්ථාන සඳහා අනනුකූල ප්‍රතිඵල දැන්වීම් නිකුත් කර තිබුණද අවශ්‍ය පිළියම් ක්‍රියාමාර්ග සඳහා ඉංජිනේරුගේ අනුමැතිය සඳහා හෝ මාර්ගයේ ඇස්පල්ට් ඇතිරීම් අඩුපාඩු කොටස පිළියම් කිරීම සඳහා සැලසුම් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර නොතිබුණි.

(v) කොන්ත්‍රාත් විශේෂ කොන්දේසි 4.18 වගන්තිය අනුව එක් එක් කොන්ත්රාත්කරු විසින් පාරිසරික නියාමන වාර්තා සෑම මාසයකම ඉදිරිපත් කළ යුතු වුවද , කොන්ත්‍රාත්කරුවන් විසින් පාරිසරික අනුකූලතා පරිපාටින් අනුගමනය නොකිරීම් අවස්ථා කිහිපයක් නිරීක්ෂණය විය. 2015 මැයි මාසයේ සිදුකරන ලද භෞතික විගණන පරීක්ෂණවලදී මැදවච්චිය - කැබිතිගොල්ලෑව මාර්ගයේ සුන්බුන් හා හැරීම් ද්‍රව්‍ය ගොඩගැසී තිබුණු බවත් ඇතාකඩ ස්ථාන ගත කර තිබූ ක්‍රෂර් (Crusher) පිරියතෙන් හා ඇස්පල්ට් පිරියතෙන් පිටවන දූවිලි පාලනය කිරීමට පියවර ගෙන නොතිබුණු බවත් නිරීක්ෂණය විය.

(vi) මැදවච්චිය - මන්නාරම මාර්ගය හා යාපනය - පන්නායි - කයිට්ස් මාර්ගයේ ප්‍රතිසංස්කරණ වැඩ සඳහා ජාතික ජල සම්පාදන හා ජලා පවහන මණ්ඩලය වෙනුවෙන් නළ හා සවි කිරීම් සැපයීම, බිම් හැරීම , ආපසු පිරවීම හා නළ එළීමේ කාර්යයන් ව්‍යාපෘතිය විසින් භාර ගෙන පිළිවෙලින් රු.මිලියන 15.9 ක් හා රු.මිලියන 16.8 ක් වූ පිරිවැය දරා තිබුණි. කෙසේ වුවද රු.මිලියන 3.8 ක් වටිනා නළ හා සවිකිරීම් අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගැනීමෙන් තොරව මාර්ග සංවර්ධන අධිකාරියේ මරදන්කඩවල විධායක ඉංජිනේරු කාර්යාලයේ නිෂ්කාර්යව පැවතුණි.

(vii) යාපනය - පන්නායි - කයිට්ස් මාර්ගය පුනරුත්ථාපනය සඳහා අත්පත් කර ගත් ඉඩම්වලට වන්දි ගෙවීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට කයිට්ස් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට රු.මිලියන 8.19 ක මුදලක් ව්‍යාපෘතිය විසින් මුදාහැර තිබුණි. කෙසේ වුවද , අයිතිකරුවන්ගේ ලැයිස්තු , භාරගත් බවට ඔවුන්ගෙන් ලැබුණු සනාථන ලිපි ආදි ගෙවීම් විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද වැය නොකළ රු.මිලියන 1.32 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් තැන්පතු ගිණුමට මාරු කර තිබුණි. තවද ඉඩම් කැබලි 76 ක අයිතිකරුවන් හඳුනාගැනීමෙන් තොරව ව්‍යාපෘතිය විසින් රු.මිලියන 2.79 ක මුදලක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදා හැර තිබූ බව නිරීක්ෂණය විය.

**3.3 මතභේදයට තුඩුදෙන කරුණු**

**----------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වල්ලායි සිට අරාලි මාර්ගයේ කිලෝ මීටර් 0 + 000 සිට කිලෝ මීටර් 27 + 400 දක්වා පුනරුත්ථාපනය කිරීම සඳහා කොන්ත්‍රාත්තුව 2011 මැයි මාසයේදී ප්‍රදානය කර තිබූ

අතර පසුව කිලෝමීටර් 4 + 140 සිට කිලෝ මීටර් 9 + 200 දක්වා මාර්ග කොටස පුනරුත්ථාපනය කිරීමේ වැඩ ආරක්ෂක හේතූන් මත අවලංගු කර තිබුණි. කෙසේ වුවද කොන්ත්‍රාත්කරු විසින් පූර්ව අනුමැතියක් නොමැතිව පුනරුත්ථාපන වැඩ සඳහා අවශ්‍ය සියලු පස් අවශ්‍යතාවයන් කිලිනොච්චි ප්‍රදේශයේ සිට ප්‍රවාහනය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතිය හා කොන්ත්‍රාත්කරු අතර පැන නැගි මතභේදය කොන්ත්‍රාත්කරුට රු.මිලියන 91.20 ක මුදලක් හා බේරුම්කරුවන්ට රු.මිලියන 1.62 ක මුදලක් ගෙවීම සඳහා එකඟවීමෙන් පසු නිරවුල් වී තිබුණි.

(ආ) ඉහත මතභේදයට අමතරව, තෝනිගල සිට ගල්කුලම මාර්ගයේ පුනරුත්ථාපනය සඳහා 2011 මැයි 10 දින ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තුව මත " Dense Graded Aggregate Base Course" සඳහා සියයට 115 කින් ප්‍රමාණ පත්‍රයන්හි සඳහන් රේටයන් වැඩි කිරීම මත වෙනත් මතභේදයක් පැන නැග තිබුණි. එබැවින් 2013 දෙසැම්බර් මාසයේදී එළඹි එකඟත්වය මත පදනම්ව ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරුට රු.මිලියන 25.70 ක මුදලක් අතිරේකව ගෙවා තිබුණි. කෙසේ වුවද සැලසුම් උපදේශක විසින් පිළියෙල කරන ලද අසම්පූර්ණ ප්‍රමාණ පත්‍රය හේතුවෙන් අදාළ මතභේදය පැන නැග තිබූ බව පසුව අනාවරණය වූ අතර වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව කිසිදු පියවරක් ගෙන නොතිබුණි.